# පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB)

# තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) HM 1-1-2016

**සුදුසුකම්** : ගණකාධිකරණය/ වාණිජ්‍යය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ ICASL/ACCA/CIMA ආයතනයක අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් සමග පශ්චාත් උපාධි (Masters) ශාස්ත්‍රපති/විද්‍යාපති සුදුසුකම් හෝ ICASL/ACCA/CIMA ආයතනයක ආශ්‍රිත/ පූර්ණ සාමාජිකත්ය සමග පිළිගත් පෞද්ගලික/ රාජ්‍ය අංශයේ ආයතනයක වසර 15 ක පශ්චාත් යෝග්‍යතා/ සුදුසුකම් ලැබීමෙන් පසු ලත් කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : HM 1-1-2016 - රු. 80,295/-, 15X2,270/-, රු. 114,345/-

ඉහත සඳහන් වැටුපට අමතරව, රජය විසින් අනුමත කර ඇති දීමනාද ගෙවනු ලැබේ.

**අතිරේක ප්‍රතිලාභ :**

(i) අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

(ii) මසකට, කිලෝමීටර් 960 ක පෞද්ගලික ධාවන දුරක් සහිතව, රථ වාහනයක් ලබා දෙනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම :**

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීමට උචිත, කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු වන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටද කැමති හා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් සිටිය යුතුය.

(iii) අනර්ඝ හා විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

(iv) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව විශිස්ට වාසියක් වනු ඇත.

අයදුම්කරුවන් විසින්, තමන් විසින්ම පිළියෙල කරන ලද අයදුම්පත්, සිය ජීවදත්ත තොරතුරු හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපින හා දුරකථන අංක ද සමග අදාළ සහතික පත්වල පිටපත් ද ඇතුළුව, කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාරේ, අංක 40 හි, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ, සභාපති වෙත, 2022 මැයි මස 24 වන දිනට හෝ ඊට පෙර ලැබෙනසේ, ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරනු ලබන තනතුර, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිළිව සටහන් කරන්න. රජයේ ආයතනවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**සැ.යු.** ගොවිපොළ ශිණුම්කරණය පිළිබඳ පළපුරුද්ද සහ සුදුසුකම් පාදකව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, තෝරා ගැනීම, සම්මුඛ, පරීක්ෂණයේදී දක්වනු ලබන, කාර්ය සාධනය මත පදනම්ව සිදුකරන ලැබේ.

පශු සම්පත් සහ වැවිලි අංශයේ, ශිණුම්කරණ කටයුතු පිළිබඳව වඩා වැඩි පළපුරුද්දක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**සභාපති,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,**
**අංක 40, නාවල පාර, නාරාහේන්පිට,**
**කොළඹ 05.**